# දුම්රිය දෙපාර්තමේන්තුවෙහි පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ සැරයන්(පිරිමි) හා සැරයන් (කාන්තා) තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය

## 01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව :ශ්‍රී ලංකා දුම්රිය

යොමු අංකය: GMA/SOR/RS-02 — දිනය: 2019.06.18
දිනය: 2023.03.23

1.2 අමාත්‍යාංශය :ප්‍රවාහන අමාත්‍යාංශය

යොමු අංකය : MT/03/04/01/02-2 — දිනය : 2019.06.21
දිනය : 2023.03.30

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/1142 — දිනය :2014.05.29
DMS/1142/IV — දිනය : 2017.10.13
DMS/1142/Vol.VIII T — දිනය : 2022.02.08

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

යොමු අංකය : EST-2/07/REC/1294 — දිනය : 2019.05.07

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:

යොමු අංකය : NSCC/02/43/SR-II — දිනය : 2019.04.05

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

යොමු අංකය : PSC/EST/04-01-43/02/2019 — දිනය : 2021.12.30
සංශෝධිත දිනය : 2023.05.30

## 02. පත්කිරීම් බලධරයා :රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද දුම්රිය සාමාන්‍යාධිකාරි

## 03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය :පොලිස් හා නියාමන සේවා

3.2 ශ්‍රේණි :අදාළ නොවේ.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

දුම්රිය සීමාව තුළ නීතිය හා සාමය සුරකිමින් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිශ්චල, චංචල දේපළ , දුම්රිය මගීන් සහ දුම්රියෙන් ප්‍රවාහනය කරන සියලුම භාණ්ඩ වලට ආරක්ෂාව සැපයීම හා අයික්ෂණ කාර්යයන්

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත

ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

## 04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු වේ.)

## 05. වැටුප්:

5.1 වැටුප් කේත අංකය :RS- 2 - 2016

5.2 වැටුප් පරිමාණය :රු.32,010-09X370-17X495-43,755/-

5.3 තනතුරු නාමය හා වැටුප් පියවර:

| අනුමත තනතුරු නාමය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු.) |
|---|---|---|
| සැරයන් | පියවර 01 | 32,010/- |

වැටුප් ගෙවීම හා අදාළ අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

## 06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සැරයන් (පිරිමි)<br><br>සැරයන් (කාන්තා) | අදාළ නොවේ<br><br>අදාළ නොවේ | 125<br><br>16 | • දුම්රිය දෙපාර්තමේන්තුවේ දේපළ, කාර්ය මණ්ඩලය හා දුම්රිය මගීන් ආරක්ෂා කිරීම.<br>• දුම්රියෙන් ප්‍රවාහනය කරන භාණ්ඩ වලට ආරක්ෂාව සැපයීම.<br>• දෙපාර්තමේන්තුවේ සිදුවන වංචා, දූෂණ,සොරකම් පිළිබඳව අදාළ පරිදි දෙපාර්තමේන්තු මට්ටමේ මූලික විමර්ශන පැවැත්වීම.<br>• තමා යටතේ සිටින කාර්ය මණ්ඩලයේ රාජකාරී අධීක්ෂණය හා තම වගකීමට අදාල ස්ථාන හා කාර්යාල වල ආරක්ෂක කටයුතු පිළිබඳව අධීක්ෂණය සහ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ අධිකාරී (දුම්රිය ආරක්ෂක) විසින් හෝ බලය පවරන ලද නිලධාරීන් විසින් වරින් වර පවරනු ලබන රාජකාරී |

6.2 ඒකාබද්ධ නිලධාරි සංඛ්‍යාව : සැරයන් (පිරිමි) 125
සැරයන් (කාන්තා) 16



09

## 07.බඳවා ගැනීමේ ක්‍රමය : බඳවා ගන්නා ප්‍රතිශතයන්:

7.1

| ධාරාව | ප්‍රතිශතය |
| --- | --- |
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 40% |
| කුසලතා | 60% |

7.2 විවෘත බඳවා ගැනීම :අදාළ නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : සැරයන්

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :අදාළ නොවේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද : දුම්රිය ආරක්ෂක පිරිමි හා දුම්රිය ආරක්ෂක කාන්තා තනතුරේ ස්ථිර , අවම වශයෙන් වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරියෙකු වීම.

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

(i) දුම්රිය ආරක්ෂක තනතුරේ සේවය ස්ථිර කර තිබීම.

(ii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(iv) ආරක්ෂක තනතුරේ කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

(v) ආරක්ෂක තනතුරට අදාළ අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කර තිබීම.



md

(vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7.3.3 **වයස** : අදාළ නොවේ.

7.3.4 **බඳවා ගැනීමේ ක්‍රමය** : ලිඛිත තරඟ විභාගයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව.

**7.3.4.1 ලිඛිත විභාගය : (විෂය නිර්දේශය සඳහා ඇමුණුම 01 බලන්න)**

| | විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | දුම්රිය ආරක්ෂක හමුදාවේ ස්ථාවර නියෝග හා දුම්රිය ආඥා පනත | 100 | 40 |
| 02 | වාණිජ පරිශිෂ්ඨය හා අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය | 100 | 40 |

7.3.4.1.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් බලය පවරන ආයතනයක් මඟින්

**7.3.4.2 වෘත්තීය පරීක්ෂණය** : අදාල නොවේ.

**7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය** :අදාල නොවේ.

**7.3.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**: අදාළ නොවේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් මඟින් හා වෙබ් අඩවියේ දැන්වීම් පලකිරීම මඟින් අයදුම්පත් කැඳවා ලිඛිත විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.4 **කුසලතා පදනම මත බඳවා ගැනීම** :

**7.4.1.බඳවා ගන්නා ශ්‍රේණිය** : සැරයන්

**7.4.2. සුදුසුකම්:**

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.2. වෘත්තිය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3. පලපුරුද්ද : දුම්රිය ආරක්ෂක (පිරිමි) හා දුම්රිය ආරක්ෂක (කාන්තා) තනතුරේ වසර අට (08) ක සක්‍රිය හා



nd

සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.4.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5. වෙනත් :

(i) දුම්රිය ආරක්ෂක තනතුරේ සේවය ස්ථිර කර තිබීම.

(ii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර අට (08) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(iv) ආරක්ෂක තනතුරේ කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

(v) ආරක්ෂක තනතුරට අදාළ අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කර තිබීම.

(vi) තනතුරට බඳවා ගැනීම සඳහා 7.4.2.1 සිට 7.4.2.5 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7.4.3 වයස : අදාළ නොවේ.

7.4.4. බඳවා ගැනීමේ ක්‍රමය: යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණුවල කුසලතාවයේ අනුපිළිවල අනුව බඳවාගනු ලැබේ.

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.4.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : කායික සුදුසුකම් හා අනෙකුත් අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇත්දැයි පරීක්ෂා කිරීම යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කරනු ලැබේ.

nd

7.4.4.4. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ:

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | අමතර සේවා පළපුරුද්ද | 60 | අදාළ නොවේ |
| 2. | දුම්රිය ආරක්ෂක තනතුරේදී දක්වන ලද ක්‍රීඩා හා නායකත්ව කුසලතා | 10 | |
| 3. | අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | 10 | |
| 4. | දුම්රිය ආරක්ෂක තනතුරේදී ලබාගත් ත්‍යාග, ප්‍රශංසා සහ පූර්වාසන්න වසර පහේ කාර්ය සාධනය | 05 | |
| 5. | භාෂා හා තොරතුරු තාක්ෂණ ප්‍රවීනතාවය | 10 | |
| 6. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | මුළු ලකුණු | 100 | |

සටහන :

I. දුම්රිය ආරක්ෂක තනතුරේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු ප්‍රමාණය මෙන් දෙගුණයක් නොඉක්මවන නිලධාරීන් සංඛ්‍යාවක් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

II. බඳවා ගැනීම් සිදුකරන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ඇත.

III. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ..

7.4.4.4.1 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියා : දුම්රිය සාමාන්‍යාධිකාරී

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් මගින් හා වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

md

## 08. කාර්යක්ෂමතා කඩඉම :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 කාර්යක්ෂමතා කඩඉම | සැරයන් තනතුරට පත්කර වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය |

**(විෂය නිර්දේශය සඳහා ඇමුණුම් 02 බලන්න.**

**8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :** වසරකට දෙවරක්

**8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද ?**

දුම්රිය සාමාන්‍යාධිකාරී

## 09. භාෂා ප්‍රවීණතාව :

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුල ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම :** අදාළ නොවේ.

**11. තනතුරට පත් කිරීම:**අදාළ නොවේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි: අදාල නොවේ**

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිවල දැක්වෙන පොදු අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:**

සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන,එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

## 14.ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මඟින් ලබා දී ඇති RS-02-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව සැරයන් තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.



nd

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිවල දැක්වෙන අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන - අදාළ නොවේ.

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

සකස් කළේ: ......................

ඒ. ජේ. පී. අයිශානි
පරිපාලන නිලධාරී ([illegible])
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

නම : ......................

තනතුර : ......................

දිනය : 2023.09.07

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

පරීක්ෂා කළේ: ......................

නම : ......................

තනතුර : ......................

එච්. නයනා එස්. පී. [illegible] ද සිල්වා
අතිරේක සාමාන්‍යාධිකාරී ([illegible]පාලන)
දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10

දිනය : 2023.09.11

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ......................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ගුණසිංහ

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

දිනය : 2023 | 09 | 12

නිල මුද්‍රාව: ......................

---

යොමු අංකය : MT/03/04/01/02 - 2

2021.12.30 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් හා නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ සැරයන් තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

 md

එම්. එම්. පී. කේ. මායාදුන්නෙ
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
7 වෙනි මහල, සෙත්සිරිපාය (අදියර II)
බත්තරමුල්ල

අත්සන : ..............................

නම : ..............................

ලේකම්

..............................අමාත්‍යාංශය

දිනය : 2023. 11. 17

නිල මුද්‍රාව : ..............................

---

යොමු අංකය : PSC/EST/04-01-43/02/2019

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021.12.30 දිනැතිව අනුමත කරනු ලැබූ සහ එම කොමිෂන් සභාව විසින් 2023.05.30 දින සංශෝධන ඇතුළත් කර සකස් කරන ලැබූ දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් හා නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ සැරයන් තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කරමි.

අත්සන : ..............................

නම : ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2023. 12. 15

නිල මුද්‍රාව : ..............................

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර

**ඇමුණුම 01**

01. විභාගයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් හා නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ සැරයන් (පිරිමි) හා දුම්රිය ආරක්ෂක සේවයේ සැරයන් (කාන්තා) තනතුරට සීමිත බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය.

02. **විභාගය පිළිබඳ විස්තර :**

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| දුම්රිය ආරක්ෂක හමුදාවේ ස්ථාවර නියෝග හා දුම්රිය අණ්ඩා පනත | පැය 03 | 100 | 40 |
| වාණිජ පරිශිෂ්ඨය හා අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය | පැය 03 | 100 | 40 |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරි හෝ ඔහු විසින් බලය පවරන ආයතනයක් මගින්**

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇතිවන්නා වූ අවස්ථාවන්හිදී**

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| දුම්රිය ආරක්ෂක හමුදාවේ ස්ථාවර නියෝග හා දුම්රිය අණ්ඩා පනත | දුම්රිය ආරක්ෂක හමුදාවේ ස්ථාවර නියෝගවල සියලුම පරිච්ඡේද ඇසුරෙන් හා දුම්රිය ආඥා පනතේ 1, 2, 7, 8, 9, 10, 11, 12, 13, 14, 23, 24, 26, 29,30, 31, 43 වගන්ති ඇසුරෙන් හා උසාවි ක්‍රියා පටිපාටියේ පැමිණිලිපත් හා චෝදනාපත් පිළියෙල කිරීම හා නඩු පැවරීම යන ඉහත විෂයයන් ආශ්‍රිතව සෑම කොටසකින්ම ප්‍රශ්න ඇතුලත් වන රචනා හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි, පිළිතුරු සැපයිය යුතු ආකාරය හා ලකුණු ප්‍රදානය කරන ආකාරයද ප්‍රශ්න පත්‍රයේම සඳහන් වේ. |
| වාණිජ පරිශිෂ්ඨය හා අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය | වාණිජ පරිශිෂ්ඨයේ වගන්ති 01,02 සහ 05 ද ඇසුරෙන් මූලික විමර්ශන කටයුතු පිළිබඳව දැනුම පරීක්ෂා කිරීමට හා අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 32 හා 136 වගන්ති සම්බන්ධයෙන් දැනුම පරීක්ෂා කිරීම සඳහා සකසන ලද රචනා හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ගුණසිංහ

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව කොළඹ 10.

දිනය : 2023|09|12

නිල මුද්‍රාව: ..............................

ඇමුණුම 02

01. **පරීක්ෂණයේ නම: දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් හා නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ සැරයන් (පිරිමි) හා දුම්රිය ආරක්ෂක සේවයේ සැරයන් (කාන්තා) තනතුරු සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.**

02. **පරීක්ෂණය පිළිබඳ විස්තර :**මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| දුම්රිය ආරක්ෂක හමුදා ස්ථාවර නියෝග හා වාණිජ පරිශිෂ්ඨය | පැය 02 | 100 | 40 |
| ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40 |
| දුම්රිය ආඥා පනත හා උසාවි ක්‍රියා පටිපාටි | පැය 02 | 100 | 40 |

03. **පවත්වනු ලබන බලධරයා :** දුම්රිය සාමාන්‍යාධිකාරී

04. **පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :**වසරකට දෙවරක්

05. **පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| දුම්රිය ආරක්ෂක හමුදා ස්ථාවර නියෝග හා වාණිජ පරිශිෂ්ඨය | දුම්රිය ආරක්ෂක හමුදා ස්ථාවර නියෝගවල සියලුම පරිච්ඡේද ඇසුරෙන් දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකි. |
| ආයතන සංග්‍රහය/රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය | ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ<br>VIII වන පරිච්ඡේදය -අතිකාල දීමනා, නිවාඩු දවස් සහ නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා<br>IX වන පරිච්ඡේදය -ගාස්තු<br>XII වන පරිච්ඡේදය-නිවාඩු<br>XIII වන පරිච්ඡේදය-දුම්රිය බලපත්‍ර<br>XIV වන පරිච්ඡේදය-දිවයින ඇතුළත රාජකාරී ගමන්<br>XVI වන පරිච්ඡේදය - නිවාඩු ගමන්<br>XVIIIවන පරිච්ඡේදය-නිල නිවාස<br>XXIVවන පරිච්ඡේදය - වැටුප් ණය සහ අත්තිකාරම්<br>XXVIII වන පරිච්ඡේදය-පරිපාලන කාර්ය පටිපාටි හා විධි<br>XXX වන පරිච්ඡේදය-රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXXIII වන පරිච්ඡේදය -නීති උපදෙස් හා ක්‍රියාමාර්ග<br>XLVII වන පරිච්ඡේදය-සාමාන්‍ය හැසිරීම හා විනය<br><br>රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ ,.<br>VII වන පරිච්ඡේදය-පත්කිරීම් වලදී අනුගමනය කළයුතු පටිපාටිය<br>VIII -පරිවාස කාලය, වැඩබැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම. |

| | |
|---|---|
| | XII වන පරිච්ඡේදය-රජයේ නිලධරයකු රජයේ සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව හෝ මුදා හැරීම<br>XIV වන පරිච්ඡේදය-පත්වීම අවසන් කිරීම හා රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම.<br>XVIII වන පරිච්ඡේදය-ස්ථානමාරු කිරීම<br>XXI වන පරිච්ඡේදය-සන්නිවේදන මාර්ග<br>වැනි පරිච්ඡේද ඇසුරින් දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකි. |
| දුම්රිය ආඥා පනත හා උසාවි ක්‍රියා පටිපාටි | දුම්රිය ආඥා පනතේ සියලුම වගන්ති හා උසාවි ක්‍රියා පටිපාටියේ පැමිණිලි පත් ද අශ්‍රිතව දැනුම හා අවබෝධය පරීක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකි. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ගුණසිංහ

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10.

දිනය : 2023/09/12

නිල මුද්‍රාව: ..........................................